1543

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා 2019/2020 අධ්‍යයන වර්ෂයට ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේ තරග විභාගය – 2018

(01) කෘෂිකර්මය

පැ එකයි

විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.

✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

1 2 3 4

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.

....

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

....

වැදගත් :

✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **07** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.

✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතු ය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

පිටුව	ප්‍රශ්න අංකය	ලැබූ ලකුණු
2	1 - 10	
3	11 - 18	
4	19 - 25	
5	26 - 33	
6	34 - 45	
7	46 - 50	
එකතුව		

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරින්	

උත්තර පත්‍ර පරීක්ෂක	
ලකුණු පරීක්ෂා කළේ	

[2 වැනි පිටුව බලන්න.

- අංක 1 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

1. 2016 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වී අස්වැන්න හෙක්ටෙයාරයට කිලෝග්‍රෑම්
   (1) 5330 කි. (2) 4372 කි. (3) 3227 කි. (4) 2781 කි. (.........)

2. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය ආරම්භ කරන ලද්දේ
   (1) 1948 දී ය. (2) 1952 දී ය. (3) 1964 දී ය. (4) 1970 දී ය. (.........)

3. ශ්‍රී ලංකාවට දිග ම දිවා කාලයක් ලැබෙන්නේ
   (1) මාර්තු 21 වෙනිදා ය. (2) ජුනි 21 වෙනිදා ය.
   (3) අගෝස්තු 21 වෙනිදා ය. (4) දෙසැම්බර් 21 වෙනිදා ය. (.........)

4. කාලගුණ මධ්‍යස්ථානයක වර්ෂාමානය සවිකළ යුත්තේ එහි පුනීලයේ කට පොළොව මට්ටමේ සිට කොපමණ උසකින් සිටින පරිදි ද?
   (1) 15 cm (2) 30 cm (3) 45 cm (4) 60 cm (.........)

5. මේද ද්‍රාව්‍ය විටමින් වන්නේ,
   (1) විටමින් A, B, C හා K ය. (2) විටමින් D, C, A හා K ය.
   (3) විටමින් A, D, E හා K ය. (4) විටමින් B, C, A හා E ය. (.........)

6. වී ශාකයක ප්‍රජනක අවධිය
   (1) දින 20 කි. (2) දින 30 කි. (3) දින 40 කි. (4) දින 50 කි. (.........)

7. ආහාර සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
   A - පිෂ්ඨය අඩංගු ආහාර ජීර්ණයෙන් ලැබෙන අවසාන ඵලය ග්ලූකෝස් ය.
   B - පලතුරු ඉදීමේ දී කාබෝහයිඩ්‍රේට පෘක්ටෝස් බවට පත්වෙයි.
   C - ලැක්ටෝස් යනු කිසිම ශාකයක අඩංගු නොවන කිරි ආහාරවල පමණක් අඩංගු වන කාබෝහයිඩ්‍රේට වර්ගයකි.

   ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශය/ ප්‍රකාශ වන්නේ,
   (1) A පමණි. (2) A සහ B පමණි.
   (3) A සහ C පමණි. (4) A, B සහ C යන සියල්ල ම ය. (.........)

8. පහත ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?
   (1) ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට, කර්මාන්ත ක්ෂේත්‍රයට වඩා කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් වැඩි දායකත්වයක් සැපයේ.
   (2) අනුරාධපුර යුගයේ ඉදි කරන ලද ප්‍රථම වැව වන්නේ අභය වැව හෙවත් බසවක්කුලමයි.
   (3) යෝධ ඇළ අඩි 40 ක් පළල හා සැතපුම් 54 ක් දිර්ඝ වූවකි.
   (4) කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙන යන්නේ ජය ගඟ හෙවත් යෝධ ඇළ මගිනි. (.........)

9. පහත දැක්වෙන සංඛ්‍යා ශ්‍රේණියේ මධ්‍යස්ථය සහ මධ්‍යන්‍යය පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

   9 , 3 , 7 , 1 , 8 , 4 , 3

   (1) 5 හා 6 (2) 6 හා 7
   (3) 4 හා 5 (4) 3 හා 4 (.........)

10. සිහින්, දිගටි හා සමාන්තර නාරටි සහිත පත්‍ර ඇති වල්පැළෑටි කාණ්ඩයක් වන්නේ මින් කුමක් ද?
   (1) පාතිනියම්, ගඳපාන, සැල්වීනියා හා කලාඳුරු
   (2) බටදැල්ල, බැලතණ, ඇටවරා, මානා හා ඉලුක්
   (3) මොනරකුඩුම්බිය, කලාඳුරු, කුප්පමේනිය හා ඇපල
   (4) සැල්වීනියා, කුඩමැට්ට, කුනැස්ස හා ඇටවරා (.........)

11. ශාකවල මල් වෙනුවට කොළ පාට පත්‍ර සෙව්වන්දියක් ඇතිවීම, ශාක කුරුවීම, පුෂ්ප කොළ පැහැවීම, එක් තැනකින් අතු රාශියක් බිහිවීම වැනි රෝග ලක්ෂණ ඇති කරන රෝග කාරකයා

(1) වෛරස් ය.
(2) දිලීර ය.
(3) බැක්ටීරියා ය.
(4) ෆයිටොප්ලස්මා ය. (.........)

12. ප්‍රභා අවධි සංවේදිතාවයෙන් විස්තර වන්නේ,

(1) ශාක වර්ධනය කෙරෙහි ආලෝකය පවතින කාල සීමාවේ බලපෑමයි.
(2) ආලෝක තීව්‍රතාව ශාක වර්ධනය කෙරෙහි බලපාන ආකාරයයි.
(3) ආලෝකයේ ගුණාත්මය ශාක පිදීම කෙරෙහි බලපාන ආකාරයයි.
(4) ශාකවල පුෂ්ප හට ගැනීම කෙරෙහි දිවා කාලයේ දිග බලපාන ආකාරයයි. (.........)

13. පිතියම්, ෆියුසේරියම් හා රයිසොක්ටෝනියා යන දිලීර නිසා ඇති වන රෝගී තත්ත්වයකි,

(1) හිටු මැරීම.
(2) දියමලන් කෑම.
(3) ඇන්ත්‍රැක්නෝස්.
(4) පත්‍ර විචිත්‍ර රෝගය. (.........)

14. ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණ වන්නේ

(1) උදැල්ල, හැඩලැලි නගුල, උදළු මුල්ලුව, රේක්කය හා රොටවේටරයයි.
(2) සැහැල්ලු යකඩ නගුල, පා මුල්ලුව, රිජරය හා අත්පෝරුවයි.
(3) රොටවේටරය, කොකු නගුල, හැඩ ලැලි නගුල හා උදැල්ලයි.
(4) හැඩ ලැලි නගුල, පා මුල්ලුව, ජපන් පරිවර්ත්‍ය නගුල හා ගැමි ලී නගුලයි. (.........)

15. කෘෂිකර්මයේ දී බහුලව ඉන්ඩෝල් ඇසිටික් ඇසිඩ් භාවිත කරනු ලබන්නේ

(1) වල්පැළ පාලනය සඳහා ය.
(2) පලතුරු ඉදවීම සඳහා ය.
(3) පුෂ්පීකරණය උත්තේජනය කිරීම සඳහා ය.
(4) දඬු කැබලිවල මුල් ඇදීම උත්තේජනය කිරීම සඳහා ය. (.........)

16. ශාක බද්ධයක් සාර්ථක වීම සඳහා අනිවාර්යයෙන් ම

(1) අනුජය හා ග්‍රාහකය එකම ප්‍රමාණයේ විය යුතු ය.
(2) අනුජයේ හා ග්‍රාහකයේ කැම්බියම් හොඳින් ස්පර්ශ විය යුතු ය.
(3) බද්ධ සන්ධිය බද්ධ පටිවලින් වෙළිය යුතු ය.
(4) අනුජය හා ග්‍රාහකය සමාන මට්ටමට මෝරා තිබිය යුතු ය. (.........)

17. ශ්‍රී ලංකාවේ දේශීය වැඩි වයස් වී වර්ග මහ කන්නයට පමණක් වගා කරන්නේ, මහ කන්නයේ

(1) වැඩි ආර්ද්‍රතාවක් පවතින නිසා ය.
(2) වැඩි වර්ෂාපතනයක් ලැබෙන නිසා ය.
(3) රෝග හා පළිබෝධ අවම නිසා ය.
(4) කෙටි දිවා කාලයක් ලැබෙන නිසා ය. (.........)

18. කෘෂිකර්මයේ දී ඇල්බට් මිශ්‍රණය බහුලව යොදා ගන්නේ,

(1) නිර්පාංශු වගාවේ පෝෂණ මාධ්‍යයක් ලෙස ය.
(2) පලතුරු ඉදීම උත්තේජනය කිරීම සඳහා ය.
(3) දිලීර රෝග මර්දනය සඳහා ය.
(4) ශාකවල පුෂ්පීකරණය උත්තේජනය කිරීම සඳහා ය. (.........)

19. කාලගුණ මධ්‍යස්ථානයක ඇති උපකරණ සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය කුමක් ද?
   (1) අනිලමානය මගින් සුළඟේ වේගය මනිනු ලැබේ.
   (2) සුළං දිශා දර්ශකයෙන් සුළං හමා යන දිශාව සොයාගත හැකි ය.
   (3) සූර්ය දීප්තමානයෙන් සූර්යාලෝකය ලැබුණු කාල සීමාව දැනගත හැකි ය.
   (4) සුළං දිශා දර්ශකයේ ඊතල හිසෙන් සුළං හමා එන දිශාව පෙන්නුම් කරයි. (.........)

20. අතුරුයත්ගෑමට අයත් කාර්ය වන්නේ
   (1) පොහොර දැමීම, අතු කප්පාදු කිරීම, ජලය දැමීම හා පළිබෝධ පාලනයයි.
   (2) ගස් මුලට පස් දැමීම, පොහොර පස් සමඟ මිශ්‍ර කිරීම හා වල් පැළ ඉවත් කිරීමයි.
   (3) ජල සම්පාදනය, රෝග පාලනය හා කෘමි පාලනයයි.
   (4) පැළ තුනී කිරීම, පොහොර දැමීම හා අස්වැන්න නෙළීමයි. (.........)

21. රෝන් මඩ අංශුවක විෂ්කම්භය මිලිමීටර
   (1) 2 - 0.2 දක්වා ය.
   (2) 0.2 - 0.02 දක්වා ය.
   (3) 0.02 - 0.002 දක්වා ය.
   (4) 0.002 ට වඩා කුඩා ය. (.........)

22. ජලය හිඟවීම නිසා ශාකයක් ස්ථිර මැලවීමට පත් වන අවස්ථාවේ එම පසේ ඇත්තේ
   (1) ජලාකර්ෂණ ජලයයි.
   (2) ගුරුත්වාකර්ෂණ ජලයයි.
   (3) කේශාකර්ෂණ ජලයයි.
   (4) කේශාකර්ෂණ හා ජලාකර්ෂණ ජලයයි. (.........)

23. ද්විතියික බිම් සකස් කිරීමට අයත් කාර්ය නම්
   (1) පස පෙරළීම, පාංශු සංරක්ෂණ ක්‍රම යෙදීම හා වල් මර්දනයයි.
   (2) පස් පිඩැලි පොඩි කිරීම, ගල් මුල් ඉවත් කිරීම, සමතලා කිරීම හා පාත්ති සැකසීමයි.
   (3) පළිබෝධ මර්දනය, ජල සම්පාදනය හා වසුන් යෙදීමයි.
   (4) බෝග සංස්ථාපනය කිරීම, වල් මර්දනය, පොහොර යෙදීම හා ජල සම්පාදනය කිරීමයි. (.........)

24. ශ්‍රී ලංකාවේ දේශගුණය සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
   A - ශ්‍රී ලංකාව ප්‍රධාන දේශගුණික කලාප තුනකට බෙදා ඇත.
   B - ශ්‍රී ලංකාව ප්‍රධාන කෘෂි දේශගුණික කලාප හතකට බෙදා ඇත.
   C - ශ්‍රී ලංකාව කෘෂි පාරිසරික කලාප තිස් හයකට බෙදා ඇත.
   ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ
   (1) A පමණි.
   (2) A සහ B පමණි.
   (3) A සහ C පමණි.
   (4) A, B සහ C යන සියල්ල ම ය. (.........)

25. ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
   A - ශ්‍රී ලංකාවේ වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර 2 500 ට වැඩි ප්‍රදේශ තෙත් කලාපයට අයත් වේ.
   B - ශ්‍රී ලංකාවේ වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර 1 750 ට අඩු ප්‍රදේශ වියළි කලාපයට අයත් වේ.
   C - ශ්‍රී ලංකාවේ වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර 1 750 හා 2 500 අතර ප්‍රදේශ අතරමැදි කලාපයට අයත් වේ.
   ඉහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශ වන්නේ
   (1) A පමණි.
   (2) A සහ B පමණි.
   (3) A සහ C පමණි.
   (4) A, B සහ C යන සියල්ල ම ය. (.........)

26. ශ්‍රී ලංකාවට, වසරේ පළමුවන අන්තර් මෝසම් වර්ෂාව ලැබෙන කාල පරාසය වන්නේ,
    (1) මාර්තු - අප්‍රේල් අතර ය.
    (2) මැයි - සැප්තැම්බර් අතර ය.
    (3) ඔක්තෝබර් - නොවැම්බර් අතර ය.
    (4) දෙසැම්බර් - පෙබරවාරි අතර ය. (.........)

27. වසර පුරාම මී පැණි ලබා ගැනීමට හැකි වන සේ මී මැසි පාලනය කිරීමට වඩා සුදුසු පරිසරයක් නිර්මාණය කෙරෙනුයේ
    (1) රබර් වගාව ආශ්‍රිතව ය.
    (2) වී වගාව ආශ්‍රිතව ය.
    (3) පොල් වගාව ආශ්‍රිතව ය.
    (4) තේ වගාව ආශ්‍රිතව ය. (.........)

28. බෝග වගාව සඳහා අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය කාණ්ඩයක් වන්නේ,
    (1) C, H, O සහ N ය. (2) P, K, Ca සහ Mg ය.
    (3) Mn, Mo, Zn, Cu, Fe සහ B ය. (4) S, P, Mg සහ Ca ය. (.........)

29. පොල්, පුවක් හා කිතුල් යන ශාක අයත් ශාක කුලය වන්නේ,
    (1) ඇරිකේසියේ ය. (2) ඉයුෆෝබියේසියේ ය.
    (3) රුටේසියේ ය. (4) පොඒසියේ ය. (.........)

30. ශ්‍රී ලංකාවේ වැඩි ම බිම් ප්‍රමාණයක වගා කර ඇති බෝගය කුමක් ද?
    (1) තේ (2) වී (3) රබර් (4) පොල් (.........)

● අංක **31** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු දී ඇති තිත් ඉරි මත ලියන්න.

31. 'ඒකාබද්ධ පළිබෝධ පාලනය' යනු කුමක් ද?

....

....

....

32. පසෙන් ජලය හානි වන ආකාර දෙකක් සඳහන් කර, එම එක් එක් ආකාරයෙන් හානි වීම වළක්වා ගත හැකි ක්‍රමය බැගින් ඉදිරියෙන් ලියන්න.

	හානි වන ආකාර	වළක්වා ගන්නා ක්‍රමය
(i)	....	....
(ii)	....	....

33. 'පාංශු ව්‍යුහය' යන්න කෙටියෙන් හඳුන්වන්න.

....

....

....

[6 වැනි පිටුව බලන්න.

34. 'පූර්ව නිර්ගමන වල්පැළ මර්දනය' යනු කුමක් ද?

....

....

....

35. ගවදෙනුන්ට වැළඳෙන බුරුළු ප්‍රදාහය (මැස්ටයිටිස් රෝගය) පාලනය සඳහා කිරි දෙවීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

(i) ....

(ii) ....

36. බිත්තර වීවල තිබිය යුතු ප්‍රවේණික පාරිශුද්ධතාව ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

....

37. කෘත්‍රිම සිංචනය සඳහා යොදා ගනු ලබන ගව ශුක්‍රාණු ගබඩා කර තබා ගන්නා උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක කීය ද?

....

38 ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මිකව වැදගත් ලෝක උරුමයක් ලෙස, කෘෂිකර්ම හා ආහාර සංවිධානය මගින් 2018 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද එල්ලංගා වැව් පද්ධතිය පිහිටා ඇති ගම්මානය කුමක් ද?

....

39. ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය පිහිටා ඇත්තේ කුමන රටෙහි ද?

....

40. ගව දෙනුන්ට වැළඳෙන 'කිරි උණ' රෝගයට හේතුව කුමක් ද?

....

41. දැනට පිළිගත් ශාක විද්‍යාත්මක වර්ගීකරණය ඉදිරිපත් කරන ලද විද්‍යාඥයාගේ නම කුමක් ද?

....

42. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ඇති කිරීම සඳහා නිර්දේශිත, ඉන්දීය කිරි ගව වර්ගයක් නම් කරන්න.

....

43. ගව දෙනකගේ කිරි මුරයක සම්මත දිග, දින කීය ද?

....

44. රසායනිකව, බීජවල ජීව්‍යතාව සෙවීමට යොදා ගනු ලබන පරීක්ෂණය හඳුන්වන්නේ කුමන නමකින් ද?

....

45. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ බහුලව ම දැකිය හැකි මහා පස් කාණ්ඩය කුමක් ද?

....

46. Bg 250 ලෙස නම් කර ඇති වී ප්‍රභේදයේ වයස කොපමණ ද?

....

47. පලතුරු ජෑම් නිෂ්පාදනයේ දී සංඝටකාරක ද්‍රව්‍යයක් ලෙස යොදා ගනු ලබන ද්‍රව්‍යය කුමක් ද?

....

48. ඉල් මැස්සා පාලනයට යොදා ගන්නා රසායනික උගුල සඳහා භාවිත කෙරෙන රසායන ද්‍රව්‍යය කුමක් ද?

....

49. පසෙහි පවතින කලිල වර්ග දෙක සඳහන් කරන්න.

(i) ....

(ii) ....

50. පුද්ගලයකුගේ ශරීර ස්කන්ධ දර්ශකය ගණනය කිරීම සඳහා යොදා ගනු ලබන සූත්‍රය හා මිනුම් ඒකකය දක්වන්න.

(i) සූත්‍රය : ....

(ii) මිනුම් ඒකකය : ....

* * *